මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\50

2023.05.30

**2023.05.30 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණය ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම දින නියමයක් නොමැතිව කල් දැමීම හේතුවෙන් තරග වැදීමට නාමයෝජනා ඉදිරිපත් කර අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වූ රාජ්‍ය/ ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා නිලධාරීන්, නැවත සේවයේ පිහිටුවීමේ දී ඔවුනට මුහුණු පෑමට සිදුව ඇති දුෂ්කර තත්ත්වය ද, ප්‍රායෝගිකව මතුවන ගැටලු ද, එක් එක් ගැටලුව වෙන් වෙන්ව සලකා බලා සුදුසු තීරණයක් ගැනීමට අදාළ ආයතන ප්‍රධානීන්ට අවශ්‍ය උපදෙස් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලබාදිය යුතු බව මැතිවරණ කොමිෂන් සභාව නිර්දේශ කර ඇති අතර, මෙම නිලධාරීන් ස්ථානගත කිරීමේ දී අදාළ ආයතන සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව මතම පදනම් නොවී අනුයුක්ත කිරීම් තාවකාලික පදනම මත ද සිදුකළ හැකි ය. තව ද පෞද්ගලිකව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී මතුවන ගැටලු සහගත තත්ත්වයන් පවතී නම් ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් ලබාගෙන ක්‍රියා කිරීම සුදුසු බව දැන්වීමට කොමිෂන් සභාව විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දෙනු ඇත.

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 53අ(3)(අ) වගන්තියෙහි ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ඇඟිලිවල තීන්ත සලකුණු කිරීමේ දී සඳහන් **"උචිත ලකුණ"** යන යෙදුමෙන් නොමැකිය හැකි තීන්තෙන් කරන ලද ලකුණක් අදහස් වේ. ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව **"උචිත ලකුණ"** යන්නට 53අ(3)(ආ) වගන්තියේ කාර්යයන් සඳහා **"යම් ලකුණකින් සලකුණු කිරීම"** යන්න ආදේශ කිරීම සඳහා අති විශෙෂ ගැසට් නිවේදනයක් නිකුත් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

එච්.එම්.ටී.ඩී.හේරත්
ලේකම්
මැතිවරණ කොමිෂන් සභාව